ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I – 2022/2023
LLU5709- පරිපාලන නීතිය
කාලය - පැය එකයි. (01)

---

දිනය - 2023 සැප්තැම්බර් 22 වේලාව - ප.ව.01.30 - ප.ව.02.30

---

ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. සංචාරක මණ්ඩලය යනු, සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. අනෙකුත් කරුණු අතර, සංචාරක ව්‍යවසායකයන් ලියාපදිංචි කිරීමට, නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට මණ්ඩලයට බලය ඇත. පනතේ 10 වන වගන්තියේ සඳහන් වන්නේ "සංචාරක මණ්ඩලය යටතේ, හෝටල් සහ අනෙකුත් නවාතැන් ලියාපදිංචි කිරීමට සංචාරක මණ්ඩලයට බලය ඇත්තේ, පනත මගින් ස්ථාපනය කර ඇති තාක්ෂණික කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව බවයි." මණ්ඩලයේ තීරණය අවසාන සහ තීරණාත්මක බව පනතේ වැඩිදුරටත් සඳහන් වේ.

රුමේෂ්, තමා අලුතින් ඉදිකරන ලද ආගන්තුක නිවාසය සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම් පතක් මණ්ඩලයට ඉදිරිපත් කළේය. පනත අනුව ආගන්තුක නිවාස යන්න, හෝටල් සහ අනෙකුත් නවාතැන්, යන අර්ථ දැක්වීමට අයත් නොවන බව පවසමින්, තාක්ෂණික කමිටුවෙන් වාර්තාවක් ලබා නොගෙනම මණ්ඩලය ඔහුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළේය. රුමේෂ් චෝදනා කළේ, ඔහු විරුද්ධ දේශපාලන පක්ෂයේ සාමාජිකයෙකු වන බැවින් මණ්ඩලය තම අයදුම්පත ප්‍රතික්ෂේප කළ බවයි.

තමාට මණ්ඩලයේ තීරණය සාර්ථකව අභියෝගයට ලක් කල හැකි කරුණු පිළිබඳව රුමේෂ් ඔබගේ උපදෙස් පතයි.

(අ) අදාල පරිපාලන නීති මූලධර්ම සහ නඩු තීන්දු ඇසුරින් ඔහුට උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 14)

(ආ) සංචාරක මණ්ඩලය, තාක්ෂණික කමිටුවෙන් වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව ද එම තීරණයම ගත්තේ නම් ඔබේ පිළිතුර වෙනස් වේ ද? අදාල අධිකාරීන් මගින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 06)

02. "පරිපාලන නීතිය තුළ බලාතික්‍රමණ මූලධර්මයේ භූමිකාව සහ ස්ථානය පිළිබඳ ව නැගී එන සාහිත්‍යයක් පවතී. මෙම මූලධර්මය පරිපාලන නීතියේ කේන්ද්‍රීය මූලධර්මය වශයෙන් සලකන සමහරු, එය නොමැතිව අධිකරණ මැදිහත්වීම් අවිනිශ්චිත පදනමක් මත රඳා පවතින බව දක්වති. අනෙක් අයට අනුව, හොඳම තත්ත්වයක් යටතේ දී බලාතික්‍රමණ මූලධර්මය යනු, අධිකරණ මැදිහත්වීම්වල සියලු අවස්ථා පැහැලිදි කිරීමට අසමත් හානිකර නොවන ප්‍රබන්ධයක් වන අතර, නරක ම තත්ත්වයක් යටතේ අධිකරණ විමර්ශනයේ යුක්තිසහගතභාවය සැඟවීමට අධිකරණයට ඉඩ සලස්වන උපකරණයක් වේ."

Craig P, "Ultra vires and the Foundation of Judicial Review" (1998)57 the Cambridge Law Journal 63'

ඉහත ප්‍රකාශය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) පරිපාලන නීතිය යටතේ, බලාතික්‍රමණ මූලධර්මයේ අර්ථය අදාල උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(ආ) ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රියාවන්හි නීත්‍යානුකූල භාවය බලාතික්‍රමණ මූලධර්මය මගින් සහතික කරනු ලබන්නේ කෙසේදැයි විවේචනාත්මකව විග්‍රහ කරන්න. ශ්‍රී ලංකාවෙන් ලබාගත් අදාල නඩු තීන්දු සහ සමකාලීන උදාහරණ ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.